**MINISTRY OF EDUCATION**

අධ්‍යාපන අමාත්‍යාංශය

**G.C.E. ORDINARY LEVEL - Rehearsal Paper**

අ.පො.ස. (සා / පෙළ ) - පෙරහුරු ප්‍රශ්න පත්‍ර

**ENTREPRENEURSHIP STUDIES**

ව්‍යවසායකත්ව අධ්‍යයනය

# QUESTION PAPER - I

# ප්‍රශ්න පත්‍රය - I




අනුග්‍රහය :

## අධ්‍යාපන අමාත්‍යාංශය

## ව්‍යවසායකත්ව අධ්‍යයනය - I

## අ.පො.ස. (සා/ පෙළ) - පෙරහුරු ප්‍රශ්න පත්‍රය

**11 ශ්‍රේණිය** **කාලය - පැය 3 යි**

සැලකිය යුතුයි:

i) සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවලට දී ඇති (1),(2),(3),(4)යන පිළිතුරු වලින් නිවැරැදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරන්න.
iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ ( ×) ලකුණ යොදන්න.
iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් සැලකිල්ලෙන් කියවා ඒවා පිළිපදින්න.

1) ව්‍යවසායකයකු තම අභිමතය පරිදි කටයුතු කරයි. මෙය හැඳින්විය හැක්කේ,

1. ස්වාධීනත්වය ලෙසය .
2. දැක්ම ලෙසය .
3. නම්‍යතාවය ලෙසය .
4. අවිනිශ්චිතතාවය ලෙසය

2) ව්‍යවසායකයාට නිරතුරුව තිබෙන ශක්තිය වනුයේ,

1. වාසනාව පිළිබඳ විශ්වාසය
2. අන් අය පිළිබඳ විශ්වාසය
3. ඉහළ මූල්‍ය ශක්තිය පිළිබඳ විශ්වාසය
4. තමා පිළිබඳ විශ්වාසය

3) ව්‍යවසායකයෙකු සෑම සමාජ සංවිධානයකට ම පොදු වූ ලක්ෂණයක් වනුයේ,

1. සංකල්පනාත්මක කුසලතා ලෙසය.
2. විශ්ලේෂණාත්මක කුසලතාවය ලෙසය.
3. තාක්ෂණික කුසලතා ලෙසය .
4. මානව කුසලතා ලෙසය.

4) අනාගතය පිළිබඳව නිවැරදිව දැකීමේ කුසලතාව හැඳින්විය හැක්කේ,

1. කළමනාකරුවන් සිටීම.
2. භෞතික ස්ථානයක් තිබීම.
3. ලාභ/ පාඩු ලැබීම.
4. අරමුණක් තිබීම

5) ව්‍යවසායකයා සැමවිටම නව්‍යතා උත්පාදකයෙකි.මෙම ගති ලක්ෂණ හඳුන්වනුයේ,

1. අන් අය අනුකරණය නොකරයි.
2. අන් අය අනුකරණය කරයි.
3. සාම්ප්‍රධායික ආකල්ප විලින් යුක්තය.
4. අළුතින් සිතීමට, අළුත් දෙයක් කිරීමට පෙළඹේ

6) ව්‍යාපාරික පරිසරයේ ඇති අවස්ථා හඳුනාගෙන අවදානම් කළමනාකරණය කරමින් නවෝත්පාදක සිදු කරන්නා ,

1. නිෂ්පාදකයා ය.
2. ව්‍යවසායකයා.
3. සැපයුම්කරුවාය.
4. ව්‍යාපාරිකයා ය.

7) ව්‍යාපාරික පරිසරයේ සිදුවන වෙනස්වීම් වලට සුදුසු පරිදි අනුවර්තනය වීමට ඇති හැකියාව,

1. අධිෂ්ඨානය වේ.
2. ස්වාධීනත්වය වේ.
3. කැපවීම වේ.
4. නම්‍යශීලීතාවය වේ.

8) ව්‍යාපාරික පරිසරයේ තරඟකාරීත්වය නිරන්තරයෙන් වෙනස් වීමට භාජනය වේ . මෙය හඳුන්වනුයේ ,

1. ව්‍යාපාරික පරිසරය ලෙසය.
2. අභියෝගතාවය ලෙසය.
3. නිශ්චිතතාවය ලෙසය.
4. අවිනිශ්චිතතාවය ලෙසය.

9) අවදානම හා ප්‍රතිලාභ අතර සම්බන්ධතාව නිවැරදිව සඳහන් ප්‍රකාශය තෝරන්න.

1. අවදානම් පහල නම් ප්‍රතිලාභ ඉහල වේ.
2. අවදානම ඉහළ නම් ප්‍රතිලාභ ඉහළ වේ.
3. අවදානම් ස්වභාවය කුමක් වුවත් ප්‍රතිලාභය ඉහළ වේ.
4. අවදානම ඉහළ නම් ප්‍රතිලාභ පහළ වේ.

10) ව්‍යවසායකත්ව ගති ලක්ෂණ ඇතුළත් කාණ්ඩය කුමක් ද?

1. අනාගත දැක්ම, නම්‍යශීලීත්වය, පෙළඹවීම.
2. සන්නිවේදනය ,සුභවාදී වීම, අලෙවිකරණය
3. නායකත්වය, සුභවාදී වීම ,නොපසුබට උත්සාහය
4. නිර්මාණශීලීත්වය, අවදානම් දැරීම ,අලෙවිකරණය

11) ව්‍යවසායකයෙකු සතු නිර්මාණශීලිත්වයේ ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපාර සංවිධානයක් තුළ ඇති විය හැක්කේ,

1. නව්‍යතා සම්පාදනය.
2. ලාභය උපරිම වීම.
3. වෙළෙඳපොළ ප්‍රසාරණය .
4. අවදානම අවම වීම.

12) ඉදිරි වර්ෂය සඳහා රජය විසින් ඉදිරිපත් කළ අයවැය ලේඛනය මගින් බදු අනුපාතය ඉහළ නැංවීම සිදු කර ඇත. මෙය ව්‍යාපාර වලට තර්ජනයකි. මෙය හඳුනාගත හැකි පරිසරය වනුයේ,

1. සමාජ සංස්කෘතික පරිසරයයි.
2. ආර්ථික පරිසරයයි.
3. ආසන්න පරිසරයයි.
4. දේශපාලන හා නෛතික පරිසරයයි.

13) ලාභ අරමුණ කර නොගත් ව්‍යාපාර සංවිධානයක් වනුයේ,

1. සුපිරි වෙළඳසැල්.
2. රජයේ පාසල.
3. මහජන බැංකුව.
4. බේකරිය.

14) ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශ්ව අතුරින් බාහිර පරිසරය නියෝජනය කරන පාර්ශ්වය වනුයේ,

1. කළමනාකරුවන්.
2. අනාගත ආයෝජකයන්.
3. සේවකයන් .
4. අයිතිකරුවන්.

15) රජය විසින් නව ව්‍යවසායකයින් සඳහා ණය යෝජනා ක්‍රමයක් හඳුන්වාදීම හැඳින්විය හැක්කේ,

1. අභියෝගයක් ලෙසය.
2. තර්ජනයක් ලෙසය.
3. තරඟකාරී වාසියක් ලෙස.
4. අවස්ථාවක් ලෙසය.

16) අලෙවි සැලැස්මක් පිළියෙල කිරීමේදී සලකා බලනු ලබන කරුණු ඇතුළත් කාණ්ඩය තෝරන්න.

1. තනතුරු සහ වගකීම්, සේවක වැටුප්, ඒකක පිරිවැය
2. සේවක වැටුප්, අලෙවිකරණ ප්‍රදේශය, ඒකක පිරිවැය
3. අලෙවිකරණ උපායමාර්ග, ඉලක්ක වෙළෙඳපොළ ,ඒකක පිරිවැය
4. ඉලක්ක වෙළෙඳපොළ ,අලෙවිකරණ උපායමාර්ග, අලෙවිකරණ ප්‍රදේශය

17) ව්‍යාපාරයක් විසින් හිමිකරගන්නා පේටන්ට් බලපත්‍රයක් යනු,

1. නීතිමය පුද්ගලභාවයභාවය තහවුරු කරන සහතිකයකි.
2. ව්‍යාපාර ආරම්භක සහතිකයයි .
3. ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයයි.
4. නව සොයා ගැනීම් වෙනුවෙන් ලබා දෙන සහතිකයකි.

18) කුඩා පරිමාණ ව්‍යාපාරයක ලක්ෂණයක් වනුයේ,

1. පුද්ගලික හිමිකාරීත්වය පැවතීම.
2. නිෂ්පාදනය ගුණාත්මකභාවය අඩුය.
3. ඉහළ ප්‍රාග්ධන ආයෝජනය.
4. විශාල වෙළඳපොල කොටසක් හැසිරවීම.

19) ව්‍යාපාර ආයතනයක ආර්ථික වගකීමක් වනුයේ,

1. ඒකාධිපතිත්වයක් ගොඩනැගීම.
2. සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීම .
3. ශ්‍රමයෙන් උපරිම ප්‍රයෝජන ගැනීම.
4. තරගකාරිත්වයට සාර්ථකව මුහුණ දීම.

20) ව්‍යාපාරිකයන්ට චෙක්පත් භාවිතා කිරීමට හැකි බැංකු ගිණුම් පවත්වාගෙන යනු ලබන්නේ,

1. ඉතිරි කිරීමේ බැංකුවලය.
2. සංවර්ධන බැංකුවලය.
3. වාණිජ බැංකුවලය.
4. ග්‍රාමීය බැංකුවලය.

21) ව්‍යවසායකයකු සැමවිටම කටයුතු කළ යුතු වන්නේ,

1. නවයාතා උත්පාදන හා ඉලක්ක සපුරා ගැනීමට.
2. ලාභ උපරිම කිරීමට හා ශ්‍රමිකයන්ගෙන් උපරිම වැඩ ගැනීමට.
3. යන්ත්‍ර සූත්‍ර අවභාවිතය හා ලාභ උපරිම කිරීමට.
4. වෙළඳපොළ ආක්‍රමණය හා තරගකරුවන් පරාජය කිරීමට.

22) ශ්‍රී ලංකාවේ වර්තමාන ව්‍යාපාර පරිසරය තුළ දැකිය හැකි ලක්ෂණයක් වනුයේ,

1. පරිසර සාධක ස්ථාවර බව
2. ඉහළ තරඟකාරීත්වය
3. අවශ්‍යතා හා වුවමනා සපුරා ගැනීමේ අවම උත්සාහය
4. භාණ්ඩ හා සේවා සීමිත බව

23) හවුල් ව්‍යාපාරයක් සඳහා සිටිය යුතු අවම සහ උපරිම හවුල්කරුවන් සංඛ්‍යා වනුයේ,

1. 2-50  2. 2-20  3. 1-50  4. 1-20

24) සීමාසහිත සමාගම් ලියාපදිංචි කරනු ලබන පනත වනුයේ,

1. 1840 අංක 7 දරන වංචා වැලැක්වීමේ ආඥා පනත
2. 1918 ව්‍යාපාර නාම ආඥා පනත
3. 2007 අංක 7 දරණ සමාගම් පනත

25) ව්‍යාපාරයකට අවශ්‍ය මුදල් පිළිබඳව තොරතුරු ඇතුළත් වන්නේ,

1. අලෙවි සැලැස්මේය.
2. නිෂ්පාදන සැලැස්මේ ය.
3. පරිපාලන සැලැස්මේ ය.
4. මූල්‍ය සැළැස්මේ ය.

26) ව්‍යාපාරිකයින් **සාම්ප්‍රදායික පුරුදු හා විශ්වාසවලින්** ඔබ්බට ගොස් ව්‍යාපාර කටයුතු කිරීමට ඇති අකැමැත්ත නිසා,

1. නව්‍යතා උත්පාදනය සීමාවේ .
2. භාණ්ඩ වල ගුණත්වය අඩුවේ.
3. ව්‍යාපාර වල පැවැත්ම කෙටිකාලීන වේ.
4. ලාභය අඩු වේ.

27) ව්‍යවසායකයින් විසින් නිර්මාණය කර සම්පූර්ණ කරනුයේ,

1. මිනිස් අපේක්ෂාවන්ය.
2. මිනිස් අවශ්‍යතාවයන් ය.
3. මිනිස් වුවමනාවන්ය.
4. මිනිස් අරමුණුය.

28) සීමිත සමාගමක් ලියාපදිංචිය සඳහා අදාළ ලිපි ලේඛන ඉදිරිපත් කළ යුතු වන්නේ,

1. ප්‍රාදේශීය ලේකම් කායීාලයටය.
2. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයටය.
3. සමාගම් රෙජිස්ටාර් කාර්යාලයටය.
4. ජනාධිපති ලේකම් කාර්යාලයටය.

29) ව්‍යවසායකයෙකු විසින් එක් නිෂ්පාදන සැලැස්මක් සකස් කිරීමේ මූලික අරමුණ වනුයේ,

1. ලාභය ගණනය කිරීමට.
2. ඒකක පිරිවැය ගණනය කිරීමට
3. නිෂ්පාදන මිල හා ලාභය ගණනය කිරීමට
4. අලෙවි ඉලක්ක සැකසීමට

30) නිෂ්පාදන කටයුතු සඳහා යොදාගන්නා යන්ත්‍රෝපකරණ ක්ෂය වීම් ඇතුළත් වනුයේ,

1. ඍජු පිරිවැය තුළ ය.
2. පොදු කාර්ය පිරිවැය තුළ ය.
3. ප්‍රාථමික පිරිවැය තුළය.
4. බෙදාහැරීමේ පිරිවැය තුලය.

31) කළමණාකරුවෙකු හා ව්‍යවසායකයෙකු අතර ඇති සම්බන්ධතාවය වනුයේ,

1. සෑම කළමනාකරුවෙකු ම ව්‍යවසායකයෙකි.
2. සෑම කළමනාකරුවෙකු ම ව්‍යාපාරිකයෙකි.
3. සෑම ව්‍යවසායකයෙකු ම කළමණාකරුවෙකු නොවෙති .
4. සෑම ව්‍යවසායකයෙකු ම කලමනාකරුවෙකි.

32) අලෙවිකරණ උපාය මාර්ග සැකසීමේදී සලකා බැලිය යුත්තේ,

1. මිල විශ්ලේෂණය.
2. වෙළඳපොළ විශ්ලේෂණය.
3. නිෂ්පාදන විශ්ලේෂණය.
4. තරඟකරුවන් පිළිබඳ විශ්ලේෂණය.

33) ආයෝජනය සඳහා උපරිම ප්‍රතිලාභ හිමි කර දීම,

1. කළමනාකරුවන්ගේ යුතුකමයි.
2. සේවකයින්ගේ යුතුකමයි .
3. රජයේ වගකීමයි.
4. ගනුදෙනු කරුවන්ගේ වගකීමයි.

34) හර්ෂණ පෙරේරා ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා මුදලින් රු.500,000ක් හා රු.280,000 ක් වටින යන්ත්‍ර උපකරණ හා රු.220,000 ක් වටින ගොඩනැගිල්ලක් යොදවන ලදී. මෙම ව්‍යාපාරය සඳහා එදිනම රු. 100,000 ක් යොදා බැංකු ජංගම ගිණුමක්ද අරම්භකරන ලදී. ව්‍යාපාරයේ මුළු හිමිකම වනුයේ,

1. රු.1,000,000 කි.
2. රු.600,000 කි.
3. රු.900,000 කි.
4. රු.500,000 කි.

35) නිෂ්පාදන ක්‍රියාවලියේ **පියවරක්** නොවන්නේ ,

1. යෙදවුම් 2. නිමැවුම 3. ක්‍රියාවලිය 4. ආයෝජනය

36) පෙරේරා නව්‍යතා උත්පාදනයට උපන් හපන් දක්ෂතා ඇති අයෙකි.ඔහු ,

1. ව්‍යාපාරික ව්‍යවසයකයෙකි.
2. ආයතනික ව්‍යවසායකයෙකි.
3. සමාජ ව්‍යවසායකයෙකි .
4. අභ්‍යන්තරික ව්‍යවසායකයෙකි.

37) ව්‍යවසායකයෙකු සතු සැලසුම් සැමවිටම ,

1. වර්තමානය හා සම්බන්ධය
2. අතීතය විශ්ලේෂණය කරයි.
3. අනාගතය හා සම්බන්ධය .
4. කිසිම කාලයකට අදාළ නොවේ.

38) ව්‍යාපාර සැලැස්මට අනුව ව්‍යාපාරයක කටයුතු සිදුවන්නේ ද යන්න සොයා බැලීමේ කාර්යය අයත් වන්නේ,

1. නිෂ්පාදක භූමිකාවටය.
2. නායකයාගේ භූමිකාවට ය.
3. අයිතිකරුගේ භූමිකාවට ය.
4. කළමනාකරුගේ භූමිකාවටය.

39) වෙළඳපල විශ්ලේෂණය තුළින් ව්‍යාපාරිකයින් හට හඳුනාගත් හැකි විශේෂ ලක්ෂණය වනුයේ,

1. ශක්තීන්ය.
2. දුර්වලතා ය.
3. අවස්ථාවන්ය .
4. තර්ජනයන් ය.

40) ව්‍යවසායකත්වය සඳහා ලැබෙන ප්‍රතිලාභය වනුයේ,

1. වැටුප්
2. ලාභ
3. පොලිය
4. බදු කුලී